# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2030/40 - 2017 අගෝස්තු මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : RPDS/LND/09/ACQ/18(VE).
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4/3/15/2011/VE/166.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුවිට කෝරළේ දකුණු උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 153 A නවනගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෙරළුප ගමේ පිහිටි අ.ග.සි. 347 හි කැබලි අංක 653 ප්‍රමාණය හෙක්ටයාර් 5.2633 ක් වූ ෆාම්ගාඩ්න්වත්ත, ජම්බුගහඅරාව, ගල්ගොඩේදෙනිය, පේඩිකුඹුර, අගලවත්ත, දිගනහේනෙවත්ත සහ තේන්නපිටවත්ත නමැති ඉඩම වේ.

*හිමිකම් කියන අය:–* බලංගොඩ වැවිලි සමාගම, තැ.පෙ. අංක 06, ෆාම්ගාඩ්න්, රත්නපුර.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017.09.23 දින පෙ.ව. 10.30 ට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2017.09.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2017 ජුලි මස 31 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08 - 676

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 26012 - 17 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.